ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கைச் சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Act No.13 of 1957
Reg.by Boy Scout International Bureau on -22.02.1953

**2026.07.08** | ***චක්‍රලේඛ අංක : 57/2026***

**සියළුම දිසා කොමසාරිස්වරුන් හා සහාය දිසා කොමසාරිස් (පුහුණු) වෙත,**

**පෝතක බාලදක්ෂ නායක - ලී පදක්කම් පුහුණුව**

**94 වන IV අදියර පෝතක බාලදක්ෂ නායක/නායිකා උසස් පාඨමාලාව**
**2026 අගෝස්තු 19 - 24**
**මීරිගම ලී දසනායක බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයේ දී**

**පෝතක බාලදක්ෂ** අංශයේ III අදියර සාර්ථක ව නිම කළ, **පෝතක බාලදක්ෂ** නායක/නායිකාවන් සඳහා **පෝතක බාලදක්ෂ** අංශයේ IV අදියර උසස් පාඨමාලාව 2026 අගෝස්තු මස 19 වන බදාදා සිට 24 වන සඳුදා දක්වා මීරිගම ලී දසනායක බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයේ දී පුහුණුකිරීමේ නායක නාමල් ගුරුසිංහ මහතා ගේ අධ්‍යක්ෂණය යටතේ පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

ඒ සඳහා මේ සමග අමුණා ඇති අයදුම් පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර, **2026 ජූලි මස 22 වන දිනට ප්‍රථම** ජාතික බාලදක්ෂ මූලස්ථානයට යොමු කරවීමට කටයුතු කරන්න.

සම්මුඛ පරීක්ෂණය 2026 ජුලි මස 30 වන බ්‍රහස්පතින්දා දින පෙ.ව 10.00 ට ජාතික බාලදක්ෂ මූලස්ථානයේ දී පැවැත්වේ.

- පාඨමාලා ගාස්තුව : රු. 5,500/- කි.

- **IV අදියර පෝතක බාලදක්ෂ නායක/නායිකා උසස් පාඨමාලාවට සහභාගීවීමට තිබිය යුතු සුදුසුකම්**

  i. III අදියර සාර්ථකව නිමා කර තිබීම.
  ii. 2026 වසර සඳහා අධිකාරී පත්‍රයක් ලබා තිබීම හෝ 2026/2025 වසරට නවීකරණය කර තිබීම.
  iii. මීට පෙර වෙනත් අංශයකින් IV අදියර පාඨමාලාවක් හදාරා ඇත්නම්, එම අංශයෙන් ලී පදක්කම දිනා, එම අංශයට වසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

- **සම්මුඛ පරීක්ෂණයට පැමිණිමේදී රැගෙන ආයුතු දේ :-**

  1. අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය
  2. අධිකාරී පත්‍රයේ පිටපතක්
  3. බාලදක්ෂ නායක ප්‍රගති පුහුණු වාර්තාව (1 - 5 පොත) සම්පූර්ණ කර පැමිණීම.
  4. 2 වන අදියර සහතිකය (2 වන අදියරින් පසු 2026 අගෝස්තු මස 19 වන දිනට මාස 06 ක සේවා කාලයක් තිබිය යුතු ය.)

5. දින **05** ක් ප්‍රායෝගික ව නේවාසික පුහුණුව ලැබීමට සුදුසු සෞඛ්‍ය තත්වයේ සිටින බවට වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

6. සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වුවහොත් පාඨමාලා ගාස්තු ගෙවීමට මුදල් රැගෙන ආ යුතු ය.

➢ **<u>සැලකිය යුතු කරුණු :</u>**

❖ අධිකාරි පත්‍රයක් නොමැති කිසිවකු පාඨමාලාවට ඇතුලත් නොකෙරේ.

❖ පාඨමාලාවට ඇතුළත් කිරීමෙන් පසු දැනුම් දීමක් කර, සහභාගි නොවුවහොත් පමණක් ගෙවූ මුදලින් 75% ක් ආපසු ගෙවනු ලැබේ.

ඉදිරි කටයුතු සංවිධානය කිරීමේ පහසුව උදෙසා නියමිත කාලය තුළ දී අයදුම් පත්‍ර යොමු කරවීමට කටයුතු කරන ලෙස කාරුණික ව දැනුම් දෙමු.

ස්තුතියි.

මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

**කර්නල් පද්මලාල් පෙරේරා**
ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්

**නීතිඥ මනෝජ් නානායක්කාර**
ප්‍රධාන කොමසාරිස්

<u>පිටපත -</u> 1. ජාතික බාලදක්ෂ මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන්
2. සභාපති/විධායක කමිටු සභාපති/ගරු ලේකම්/ගරු භාණ්ඩාගාරික - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය